# මුදල් අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය,

## රැකියා පුරප්පාඩු

මුදල් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, දැනට අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, ජාතික ස්වාභාවික ආපද රක්ෂණාවරණය වැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් 2008 වර්ෂයේ සිට කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. 2006 වර්ෂයේදී පිහිටුවන ලද මෙම අරමුදල් මණ්ඩලය වසර 12ක කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. සහකාර සාමාන්‍යාධිකාරී -- මෙහෙයුම්

**සුදුසුකම් සහ පළපුරුද්ද**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය/ පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

   **සහ**

   කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

   **හෝ**

   වරලත් වෘත්තිය කළමනාකරණ ආයතනයක් වෙතින් විෂය ක්ෂේත්‍රයට අදාළව ආයතනික සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

   **හෝ**

2. වරලත් වෘත්තිය ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Full Membership)

   **සහ**

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සුදුසුකම් **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක කළමනාකරණ මට්ටමේ 1 ශ්‍රේණියේ සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය** : HM 1-3-2016 - රු.86,865.00 - 15X2,270 - 120,915

(කළමනාකරණ සේවා චක්‍රලේඛ -02/2016 අනුව 2020.01.01 වර්ෂයේ සිට හිමිකම් ඇත.)

2019 වර්ෂය සඳහා මූලික වැටුප රු.77,841/-ක් වේ.

**වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම** : මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ** :

- රජයේ අනුමත නෛතික ප්‍රතිපාදනයන්ට යටත්ව වාහන දීමනාවක් හා ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.
- ජාතික රක්ෂණ භාර අරමුදලට පමණක් අදාළ දීමනාවන්
- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.
- වෘත්තිය සාමාජිකත්වය අලුත් කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික දායක මුදල් සඳහා අනුග්‍රාහකත්වය දක්වනු ලැබේ.
- අධ්‍යාපනය සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය
- දේපළ සහ වෙනත් ණය පහසුකම්

## 2. ආයුගණක කළමනාකරු

### සුදුසුකම් සහ පළපුරුද්ද

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ආයුගණක විද්‍යාව / ගණිතය හෝ සංඛ්‍යාතය පිළිබඳ උපාධියක් හෝ එම ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

   **හෝ**

2. වරලත් ආයුගණක වෘත්තිය ආයතනයක් වෙතින් ආයුගණක විෂය ක්ෂේත්‍රයට අදාළ විභාග සමත් වී තිබීම.

   **සහ**

   විභාග සමත් වීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සුදුසුකම් සපුරා තිබීම.

**වැටුප් පරිමාණය** : MM 1-2-2016 - රු.54,550.00 - 10X1,375 -15X1,910 - 96,950

(කළමනාකරණ සේවා චක්‍රලේඛ -02/2016 අනුව 2020.01.01 වර්ෂයේ සිට හිමිකම් ඇත.)

2019 වර්ෂය සඳහා මූලික වැටුප රු.48,761/-ක් වේ.

**වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම** : මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ** :

- ජාතික රක්ෂණ භාර අරමුදලට පමණක් අදාළ දීමනාවන්
- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.
- වෘත්තිය සාමාජිකත්වය අලුත් කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික දායක මුදල් සඳහා අනුග්‍රාහකත්වය දක්වනු ලැබේ.
- අධ්‍යාපනය සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය
- දේපළ සහ වෙනත් ණය පහසුකම්

### ඉහත 1 සහ 2 තනතුරු සඳහා

**කොන්දේසි** :

සියලුම අයදුම්කරුවන්,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

### අයදුම්පත්‍ර

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තිය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- **අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කර ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02** යන ලිපිනයට **2019.09.16 දිනට පෙර** එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය,**
**නො: 95,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,**
**කොළඹ 02.**